ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

වෙළඳපොළ මෙහෙයුම් දෙපාර්තමේන්තුව
சந்தைத் தொழிற்பாடுகள் திணைக்களம்
MARKET OPERATIONS DEPARTMENT

අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
இல. 30, சனாதிபதி மாவத்தை, கொழும்பு - 01, இலங்கை
No. 30, Janadhipathi Mawatha, Colombo 01, Sri Lanka

චක්‍රලේඛ අංක: 2026 අංක 02

2026 මැයි 29

සියලුම සහභාගීත්ව ආයතන වෙත

**නිත්‍ය තැන්පතු පහසුකම යටතේ තැන්පතු භාරගන්නා අවසන් වේලාව සංශෝධනය කිරීම**

ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් 2026 මැයි 29 වන දින නිකුත් කරන ලද 2026 අංක 01 දරන තත්කාලීන දළ පියවුම් පද්ධති චක්‍රලේඛයට අනුව, 2026 ජුනි 01 වන දින සිට බල පැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම යටතේ තැන්පතු භාරගන්නා අවසන් වේලාව (cut-off time) ප.ව 4.00 ලෙස සංශෝධනය කෙරෙන අතර, නිත්‍ය ණය පහසුකම යටතේ ණය ලබා දෙන අවසන් වේලාව ප.ව 3.30 ලෙස නොවෙනස්ව පවතින බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒ අනුව; මෙම චක්‍රලේඛය මගින් වෙළෙඳපොළ මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2021 අංක 01 දරන ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස් සඳහා වන චක්‍රලේඛයෙහි 31 වන වගන්තිය සංශෝධනය කෙරේ.

සියලුම සහභාගීවන්නන් නිත්‍ය තැන්පතු පහසුකම යටතේ තැන්පතු භාරගන්නා අවසන් වේලාවට අනුකූල වන ලෙස මෙයින් උපදෙස් දෙනු ලැබේ.

අත්සන් කළේ,
ආචාර්ය ආර්. ඒ. අනිල් පෙරේරා
අධ්‍යක්ෂ/ වෙළඳපොළ මෙහෙයුම්

011-2477036 011-2477783 dmod@cbsl.lk www.cbsl.gov.lk